# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 11

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 27-02-2018 |
|---|---|---|

| | | |
|---|---|---|
| පැමිණිලිකරු | : | එන්. ජමලෝන් මයා.<br>අංක 287/20. පොල් අත්ත පිටිය.<br>දඹුල්ල පාර. කුරුණෑගල. |
| වගඋත්තරකරුවන් | : | පො. කො. 23922 සූරිය බණ්ඩාර මයා.<br>රථවාහන අංශය.<br>මූලස්ථාන පොලිස් ස්ථානය.<br>කුරුණෑගල. |
| <u>පැමිණිලි අංකය</u> | <u>:</u> | <u>**HRC/889/14/I-23**</u> |

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්. තමා කුරුණෑගල. දඹුල්ල පාර මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සිදු කරනු ලබන බවත්. 2014.01.13 දින තමා අලුත්වැඩියා කිරීමට ලබා දුන් යතුරුපැදියට කොටස් ලබා ගැනීම සඳහා එම යතුරු පැදියෙන්ම කුරුණෑගල ප්‍රදේශයට ගිය බවත්. එහිදී පළමුවන වගඋත්තරකරු තමාට පරුෂ වචනයෙන් බැණ තමාගේ රියදුරු බලපත්‍රය ඉල්ලා සිටි බවත්. පරුෂ වචනයෙන් බැණ වැදීම නිසා තමා එය ලබා නොදුන් බැවින් තමා යතුරු පැදිය පණ ගන්වා යාමට උත්සාහ කිරීමේදී යතුරු පැදියට පයින් ගැසූ බවත්. තමා යාමේදී තමාගේ කොණ්ඩයෙන් ඇද තමාගේ කණට හිස් වැසුමෙන් පහරදුන් බවත් සඳහන් කර ඇත.

ඉන් පසුව එතැණින් පිටව ගොස් තමා යතුරුපැදිය තම ගරාජයට දමා ත්‍රිරෝද රථයෙන් රෝහලට ගිය බව සඳහන් කර ඇති අතර. තමාට අමානුෂික ලෙස පහරදීම නිසා රැකියාව නිසියාකාරව කර ගැනීමට නොහැකි වූ බවත්. ඒ තුලින් ආර්ථික පාඩු විදීමට සිදු වූ බවත් සඳහන් කර ඇත.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන
ලේකම්
ක්ෂණික 011-2505575
වෙබ්

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

වගඋත්තරකාර පො. කො. 23922 සූරිය බණ්ඩාර යන අය විසින් සඳහන් කර ඇත්තේ, 2014.01.13 දින පො.කො. 33642 සුනිල් ශාන්ත නිලධාරී හා තමා යතුරුපැදියෙන් රථවාහන හැසිරවීමේ රාජකාරී සඳහා පිටව ගිය බවත්, එහිදී රාජකාරියේ යෙදී සිටියදී වාහන තදබදයක් වූ අතර එම අවස්ථාවේදී කොට කලිසමක් හා ටීෂර්ට් එකක් ඇඳගත් කාන්තාවක් තිතිය කඩකරමින් සිය රථය විරුද්ධ දෙසට එනම් තමන් රාජකාරී කළ දෙසට ධාවනය කළ බවත්, ඒ අනුව එම යතුරුපැදිය නවතා වරද පහදා දී රියදුරු බලපත්‍රය ඉල්ලා සිටියදී ඇය විසින් රියදුරු බලපත්‍රය ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත් සඳහන් කර ඇත.

ඇය විසින් පරුෂ වචනයෙන් බැණ යතුරු පැදියෙන් පිටව ගිය බවත්, තමා යතුරු පැදියෙන් ඇය පසු පස ගිය නමුත්, වාහන තදබදය නිසා වාහනය ලුහුබැඳීමට නොහැකි වූ බවත්, නමුත් ඇය පදවා ගිය යතුරුපැදිය බුදු පිළිමය ළඟ දමා ගොස් තිබූ නිසා එම යතුරුපැදිය තම සහයක නිලධාරියා විසින් ගෙනවිත් පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බවත්, සඳහන් කර ඇත.

එම අවස්ථාවේදී එහි සිටි ත්‍රිරෝද රථ රියදුරන් පැමිණිලිකාරියගේ නම හා ලිපිනය ලබා දුන් බවත් දක්වා සිටින අතර, පහරදීමක් නොකළ බවත්, පසුව අනතුරුදායක ලෙස රිය පැදවීම, ආදායම් බලපත්‍රය නොමැතිව ධාවනය, රක්ෂණ සහතිකය නොමැතිව ධාවනය, තහනම් පුවරුවට විරුද්ධව ධාවනය, පොලිස් සංඥාවට අවනත නොවීම, ලියාපදිංචි නොකර ධාවනය, 157-7457 තහඩුව වංචනික ලෙස භාවිතය යන වැරදි සම්බන්ධව අධිකරණයට කරුණු වාර්තා කළ බවත් දක්වා ඇත.

විමර්ශනය :-

පැමිණිලිකාරිය මූලිකවම කොමිෂන් සභාවේ අවධානයට ලක් කර ඇත්තේ වගඋත්තරකාර පොලිස් නිලධාරියා තමාට පහර දී අවමානයට ලක් කිරීම යන කාරණය වේ.

ඒ අනුව මෙම පැමිණිල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැමිණිලිකාරිය හා වගඋත්තරකාර පාර්ශවය අතර හමුවීමක් සිදුවී ඇති බව නිරීක්ෂණය වී ඇති අතර, එහිදී පැමිණිලිකාරිය දක්වා ඇත්තේ, තමා යතුරුපැදියකින් කුරුණෑගලට ගිය විට වගඋත්තරකරු පරුෂ වචනයෙන් බැණ රියදුරු බලපත්‍රය ඉල්ලා සිටි බවත්, පරුෂ වචනයෙන් බැණ වැදීම තමා එය ලබා නොදී යාමට උත්සාහ කිරීමේදී පහර දුන් බවයි. වගඋත්තර පාර්ශවය දක්වා ඇත්තේ වැරදි දෙසට ධාවනය කිරීම නිසා රථය නවතා රියදුරු බලපත්‍රය ඉල්ලුම් කළ විට පැමිණිලිකාරිය පරුෂ වචනයෙන් බැණ පලා ගිය බවයි.

ඒ අනුව දෙපාර්ශවය දක්වන ඉහත කරුණු අනුව රියදුරු බලපත්‍රය ලබා ගැනීම සම්බන්ධව සිද්ධිමය කරුණක් සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. එදින එහි සහයට සිටි අනෙක් නිලධාරියා වූ පො.කො. 23642 සුනිල් ශාන්ත නිලධාරී කොමිෂන් සභාවේදී 2016.03.01 දින ලබා දුන් ප්‍රකාශයේදී දක්වා ඇත්තේ, පැමිණිලිකාරිය විසින් පරුෂ වචනයෙන් බැණ වැදීමක් නොකළ බවත්, රියදුරු බලපත්‍රය රැගෙන එන බවට පිටත්ව ගිය බවත්ය. නමුත් එය වගඋත්තරකරු දක්වන කරුණුවලට පටහැනි වේ.

අධිකරණ වෛද්‍ය වාර්තාව :-

පැමිණිලිකාරිය දක්වා ඇති පහරදීම සනාථ කිරීම සඳහා අධිකරණ වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැමිණිලිකාරිය සිද්ධිය වූ දිනම රෝහල්ගත වී අධිකරණ වෛද්‍ය නිලධාරී පරීක්ෂා කර ඇති බවත් නැවත පැමිණිලිකාරියගේ කණෙන් ශ්‍රාවයක් ඇතිවීම හේතුවෙන් සිද්ධිය වී දින 09 කට පසු රෝහල් ගතවීමෙන් පසු උගුර, කණ, නාසය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙකු පරීක්ෂා කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම, එහි රෝගියා විසින් දෙනු ලබන රෝගී ඉතිහාසයද "කොණ්ඩෙන් ඇදලා හෙල්මට් එකෙන් ගැහැව්වා" ලෙස දක්වා ඇත. එහිදී අධිකරණ වෛද්‍ය වාර්තාවේ නිගමනය හා වෛද්‍ය වරයාගේ මතය ලෙස දක්වා ඇත්තේ බාහිරව කිසිදු තුවාලයක් දක්නට නොමැති බවයි. නමුත්, ඊට පසුව පරීක්ෂා කළ උගුර, කණ, නාසය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයා විසින් (Ruptured ear drum) කන් බෙරය පැලී ඇති බව විමර්ශනයේදී අනාවරණය කර ගත් බවත්, එම තත්ත්වය ලබාදී ඇති රෝගී ඉතිහාසය හා සැසෙදෙන බවත්, දක්වා ඇත. මෙම තත්ත්වය බරපතල ගනයෙහිලා වැටෙන බවත් දක්වා ඇත. එසේම, අධිකරණ වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති තුවාල ස්වභාවයත් සහ පැමිණිලිකාරිය දක්වන පහර දුන් ආකාරය හා සැසඳෙන බව නිරීක්ෂණය වේ.

තවදුරටත් පැමිණිලිකාරිය විසින් පහරදීමට අදාළව ඇසින් දුටු සාක්ෂි දිවුරුම් ප්‍රකාශ මගින් ලබා දී ඇති නමුත්, එහිදී දක්වා ඇත්තේ වගඋත්තරකරු පරුෂ වචනයෙන් බැණ අමානුෂික ලෙස පහර දුන් බව තමා දුටු බවය. එහිදී පහර දුන් ආකාරය පිළිබඳ කරුණු ඇසින් දුටු සාක්ෂි ඉදිරිපත් කර නොමැත. ඒ අනුව පහරදීමට අදාළ ඇසින් දුටු සාක්ෂි ප්‍රබල සාක්ෂියක් ලෙස මෙහිදී සැලකීමට නොහැකි වේ. නමුත් ඇසින් දුටු සාක්ෂි නොතිබීම මත වගඋත්තර පාර්ශවය පැමිණිලිකාරියට පහරදීම යන්න බැහැර නොකරනුයේ අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් හා සිද්ධිමය කරුණු තුලින් වධහිංසාව තහවුරු කරන බැවිණි.

නිගමනය :-

ඒ අනුව වගඋත්තරකරු විසින් පැමිණිලිකාරිය වධහිංසාවට ලක් කිරීමක් සිදුකර ඇති බවට නිරීක්ෂණය වන අතර එතුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. වගඋත්තරකරු විසින් පැමිණිලිකාරිය වෙත රු.20,000/- ක වන්දි මුදලක් ලබාදිය යුතුය.

02. වගඋත්තරකරු සම්බන්ධව දෙපාර්තමේන්තු මට්ටමින් විනය ක්‍රියාමාර්ග ගැනීමට මෙය පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

2018.03.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර

B/